# මාධ්‍ය නිවේදනය

2018 ඔක්තෝබර් මස 16 වන දින පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වූ කරුණු සම්බන්ධයෙන් අද දින මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් පළ කරනු ලැබ ඇති ප්‍රවෘත්ති පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු වී ඇත. එම ප්‍රවෘත්ති සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් තොර බව අවධාරණය කරනු ලැබේ.

යටිතල පහසුකම් සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව ඉන්දීය රජය විසින් හෝ ඉන්දීය සමාගම් විසින් මෙරට ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරෙන ව්‍යාපෘතිවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ කිසිවක් එම රැස්වීමේ න්‍යාය පත්‍රයේ ඇතුළත්ව නොතිබුණි.

මෑතකදී නේපාලයේ පැවැති බිම්ස්ටෙක් සමුළුව අතරවාරයේදී දෙරටට වැදගත් වන අන්‍යොන්‍ය කරුණු මෙන්ම කලාපයේ හා ජාත්‍යන්තර තලයේ වැදගත් කරුණු සම්බන්ධයෙන් ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා හා තමන් අතර පැවැති සාකච්ඡාවේදී අවධානයට යොමු වූ වැදගත් කරුණු පිළිබඳව මෙම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරන ලදී. එම සාකච්ඡා තුළින් දෙරට අතර පවතින දිගු කාලීන සමීප මිත්‍රත්වය තවත් තහවුරු වූ බව එතුමා විසින් අවධාරණය කරන ලදී.

එබැවින් අමාත්‍ය මණ්ඩලයේ සාකච්ඡා වන කරුණු පිළිබඳව වාර්තා කිරීමේදී අමාත්‍ය මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශක ගරු අමාත්‍යතුමන්ලා විමසමින් කරුණු තහවුරු කරගෙන අදාළ වාර්තා පළ කිරීම කෙරෙහි සිය අවධානය යොමු කරන ලෙස සියලුම මාධ්‍ය ආයතන වෙතින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

2018 ඔක්තෝබර් මස 17 දින.

එස්. අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ජනරජ චතුරශ්‍රය.
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ - 01